**<u>පරිපාලන අංශය</u>**

**<u>නෛතික පදනම</u>**

රාජ්‍ය සේවා කොමිශන් සභා කාර්ය පටිපාටි සංග්‍රහය, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සංග්‍රහය, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, දීප ව්‍යාප්ත සේවා හා ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථා හා දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ බඳවා ගැනීමේ පටිපාටි, අපි වෙනුවෙන් අපි අරමුදල් පනත, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය ප්‍රමුඛව රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා ගැසට්පත්‍ර මඟින් දක්වා ඇති කරුණු හා මාර්ගෝපදේශ පරිපාලන අංශයේ ආයතනික කාර්යයන්හි නෛතික පදනම වේ.

**<u>කාර්යයන් හා බලතල</u>**

**01. <u>පිරිස් පරිපාලන සම්බන්ධ කටයුතු</u>**

ආරක්ෂක අමාත්‍යාංශය හා යටතේ වූ ආයතන වන රාජ්‍ය බුද්ධි සේවයේ, ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය, පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය,, ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය, යන ආයතන වල සිවිල් නිලධාරීන් බඳවා ගැනීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් ඇතුලත්ව සියලුම පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හා ඊට අනුෂාංගික ආයතනික කටයුතු.

**02. <u>මානව සම්පත් සංවර්ධනය</u>**

දේශීය හා විදේශීය පුහුණු පාඨමාලාවන්ට නිලධාරීන් සහභාගී කරවීම හා කාර්මික හා වෘත්තීය පුහුණු ආයතන වල අභ්‍යාසලාභීන් සඳහා පුහුණු අවස්ථා ලබාදීම.

**03. <u>ආයතනික කටයුතු (අනෙකුත් දෙපාර්තමේන්තුවල)</u>**

යුධ, ගුවන් හා නාවික යන දෙපාර්තමේන්තුවල සේවය කරන සියලුම මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් සම්බන්ධ ආයතනික කටයුතු. (පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හැර)

**04. <u>නඩත්තු කටයුතු සිදු කිරීම</u>**

ආරක්ෂක අමාත්‍යාංශය හා යටතේ වූ ආයතන වන මාධ්‍ය කේන්ද්‍රය, ජාතික ආරක්ෂක අධ්‍යයක ආයතනය, රාජ්‍ය බුද්ධි සේවය, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය, යන ආයතන වල නඩත්තු කටයුතු සිදු කිරීම.

## 05. රණවිරු සුභසාධනය.

5.1 රණවිරුවන් සඳහා නිවාස ලබාදීම.

a. රජයේ අරමුදලින් ලබාදෙන සත්විරු සංහිඳ අර්ධ නිවාස ව්‍යාපෘතිය.

b. "අපි වෙනුවෙන් අපි" අරමුදලින් ලබාදෙන අර්ධ නිවාස ආධාර හා පූර්ණ නිවාස ලබාදීම.

| ව්‍යාපෘතිය | අරමුණු | වැයකරන මුදල් හා ශ්‍රමය | ප්‍රතිලාභීන් |
|---|---|---|---|
| සම්පූර්ණ නිවාස ව්‍යාපෘතිය | තමාටම කියා නිවසක් නොමැති රණවිරුවන් හට ඉදිකර අවසන් සම්පූර්ණ නිවසක් ප්‍රදානය කිරීම | • එක් සම්පූර්ණ නිවසකට ඉදිකිරීම් අමුද්‍රව්‍ය සඳහා රු.1,500,000.00 ක් වැය කෙරේ. | ත්‍රිවිධ හමුදා රණවිරුවන් ප්‍රතිලාභීන් ලෙස තෝරාගැනෙන අතර එක් එක් ව්‍යාපෘතියට අදාල සුදුසුකම් පරීක්ෂා කර තෝරාගැනේ.<br><br>➢ යුධ හමුදාව වෙතින් - 60%<br>➢ නාවික හමුදාව වෙතින් - 25%<br>➢ ගුවන් හමුදාව වෙතින් - 15% |
| අර්ධ නිවාස ව්‍යාපෘතිය | තම ස්වෝත්සාහයෙන් අඩක් නිමකළ නිවාස සහිත රණවිරුවන්ගේ නිවාස සම්පූර්ණ කිරීමට මූල්‍යාධාර පිරිනැමීම. | • අර්ධ නිවසක් සම්පූර්ණ කිරීම සඳහා රු 750,000.00 ක උපරිමයකට යටත් මුදලක් මූල්‍යාධාර ලෙස පිරිනමන අතර එය වාරික 03 ක් යටතේ ලබා දේ. | |
| රණවිරු ණය නිදහස් කිරීමේ ව්‍යාපෘතිය. | නිවසක් තැනීමට හෝ ඉදිකල නිවසක් මිලදී ගැනීමට ණය මුදල් ලබා ගත් රණවිරුවන් එම ණය බරින් මුදවා ලීමට මූල්‍යාධාර පිරිනැමීම.<br>(මෙම ව්‍යාපෘතිය සාකච්ඡා මට්ටමේ පවතී) | උපරිමය රු.1,000,000.00 ක් ලෙස ණය බරින් නිදහස් වීමට අදාල මූල්‍යායතන වෙත ලබා දීමට සැලසුම් කරමින් පවතී. | |

5.2 රණවිරුවන් සම්බන්ධයෙන් වූ වෙනත් සුභසාධන කටයුතු.

a. මිහිඳු සෙත් මැදුර ව්‍යාපෘතිය.

b. ඉපලෝගම රණජයපුර නිවාස ව්‍යාපෘතිය.

<u>**සන්නද්ධ හමුදා සුබසාධන අංශය**</u>

**නෛතික පදනම හා බලතල**

ආරක්ෂක අමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරනු ලැබූ අමප/07/0525/305/019 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව 2007 අප්‍රේල් 04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත කරනු ලැබ අමාත්‍ය මණ්ඩලයේ අධිකාරිය මත ආරක්ෂක අමාත්‍යාංශය යටතේ සන්නද්ධ හමුදා සුබසාධන අංශය පිහිටුවා ඇත. එය අංක 1501/15 හා 2007 ජුනි 13 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇත.

එයට අමතරව 1985 අංක 09 දරන ආරක්ෂක අරමුදල් පනතින් ප්‍රකාශිත ආරක්ෂක අරමුදල පවත්වාගෙන යාම සඳහා 2015 ජනවාරි 18 දිනැති අංක 1897/15 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්ය භාරය දැක්වෙන II වැනි තීරුව අනුව බලය පැවරී ඇත.

රාජ්‍ය සේවයේ නියුතු රණවිරු පවුල්වල සාමාජිකයන් සඳහා පත්කිරීම් හා ස්ථාන මාරු සිදු කිරීමේදී සහන සැලසීම සඳහා කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමා (සන්නද්ධ හමුදා සුබසාධන අධීක්ෂණ අමාත්‍යවරයා ලෙස) ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 09/0531/357/003 දරන සටහන සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් අනුමැතිය.

**සංවිධාන තොරතුරු**

අතිරේක ලේකම් (පරිපාලන)

↓

අධ්‍යක්ෂ (විශේෂ විමර්ශන) ( තනතුරු පුරප්පාඩු )

↓

සහකාර අධ්‍යක්ෂ (සන්නද්ධ හමුදා සුබසාධන) එච්. පී. ඩී. හේවගේ මයා (ශ්‍රී ලංකා පරිපාලන සේවය III)
දු.ක. 011 2 430 860 දිගුව 347

**ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් හා මහජන සේවා තොරතුරු**

අප මව්බිමේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් තම දිවි පරදුවට තබා සටන් කළ ත්‍රිවිධ හමුදාවේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් වෙනුවෙන් සුභසාධන කටයුතු සිදුකිරීම.

**ඒ වෙනුවෙන් පහත සඳහන් කාර්ය භාරයන් ඉටුකරනු ලබයි.**

1. ඉඩම් නොමැති රණවිරුවන්ට නිවාස ඉදිකර ගැනීම සඳහා ඉඩම් කොටස් ලබාදීම.
    - I. මේ සඳහා නෛතික ප්‍රතිපාදන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2016/07 චක්‍ර ලේඛය මගින් ලැබී ඇත.
    - II. රණවිරුවන් වෙත ලබා දිය හැකි ඉඩම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සම්බන්ධීකරණයෙන් වෙන් කරගෙන ඇත.
    - III. ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2016/07 චක්‍ර ලේඛනයේ සුදුසුකම් සපුරන රණවිරුවන් විසින් අයදුම්පත් කැඳවන ඉඩම් සඳහා පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
    - IV. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් දැනුම්දෙන පරිදි සුදුසුකම් පරීක්ෂණ හා ඉඩම් කච්චේරි සඳහා සහභාගී විය යුතුය.
    - V. ඉඩම් ලබා ගැනීමට සුදුසුකම් ලැබූ රණවිරුවන් ඉඩම් හිමිකම ලැබුණු විගස ඉඩම හෙළි පෙහෙළි කොට නිවස ඉදි කිරීම සඳහා ක්‍රියා කළ යුතුය.

VI. රජයේ ඉඩමක පදිංචි රණවිරුවන්ට තක්සේරු මුදලින් 10%ක් පමණක් ගෙවා දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබා ගත හැකිය.

VII. රජයේ ඉඩමක පදිංචි මිය ගිය රණවිරුවන්ගේ පවුල්වලට හා පූර්ණ ආබාධිත රණවිරුවන්ට නොමිලයේ දීමනා පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

2. ත්‍රිවිධ හමුදාවේ සේවයේ නියුතු සහ විශ්‍රාමික රණවිරුවන් දැනටමත් භුක්ති විඳින රජයේ ඉඩම් සඳහා නීත්‍යානුකූල හිමිකම් ලබාදීමේදී අදාල නිර්දේශ ලබාදීම හා ඉඩම්වල වෙනත් ගැටලුකාරී තත්වයන් විසඳා ගැනීමට සහය වීම.

3. මහවැලි ඉඩම් සම්බන්ධයෙන් ද ඉහත වැඩපිළිවෙළ අනුව හා මහවැලි අධිකාරියේ අනුමැතිය මත එම ඉඩම්වල ගැටලුකාරී තත්වයන් විසඳා ගැනීමට සහය වීම.

4. ජාතික ආරක්ෂක අරමුදලේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාන්විතයේදී මියගිය හා ආබාධිත රණවිරුවන්ගේ දරුවන්ට ශිෂ්‍යාධාර ලබාදීම.

I. යුදමය හේතු මත මියගිය රණවිරුවන්ගේ ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන් සහ යුදමය හේතු මත ආබාධිත රණවිරුවන්ගේ ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන් මේ සඳහා සුදුසුකම් ලබයි.

II. ආරක්ෂක අමාත්‍යාංශය විසින් අයදුම්පත් භාර ගැනීම ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල පිට වූ පසු ආරම්භ වේ.

III. සියලුම අයදුම්පත් අදාළ හමුදාවේ සුබසාධක අංශය විසින් නිර්දේශ කොට එක වර ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලබා දිය යුතුය.

IV. සුදුසුකම් ලබන සියලුම දරුවන්ට රු. 25000.00ක ශිෂ්‍යාධාර මුදල තැන්පත් කළ බැංකු ගිණුමක් හිමිවේ.

V. අදාළ වයස සම්පූර්ණ කළ ශිෂ්‍යත්ව ලාභීන්ට ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත අධ්‍යාපන කටයුතු වෙනුවෙන් බැංකු ගිණුමෙන් මුදල් ලබා ගත හැකිය. මේ සඳහා වූ ඉල්ලීම් ලිපි අදාළ හමුදාවේ සුබසාධන අංශයේ නිර්දේශය සහිතව ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

5. රණවිරුවන්ගේ දරුවන් රජයේ පාසල් වෙත ඇතුලත් කිරීමේදී පැන නගින ගැටලුකාරී තත්වයන් වෙනුවෙන් කටයුතු කිරීම. (2 සිට 5 ශ්‍රේණිය දක්වා හා 7 සිට 10 ශ්‍රේණිය දක්වා පමණි)

I. රණවිරුවාගේ සේවා අවශ්‍යතා හා පෞද්ගලික අපහසුතා හේතුවෙන් දරුවන් වෙනත් පාසල් වෙත ඇතුළත් කර ගැනීම අවශ්‍ය වූ විට ඉල්ලීම් යොමු කළ හැකිය.

II. රණවිරුවා විසින් සියලු විස්තර ඇතුළත් කොට යොමු කරනු ලබන සංක්ෂිප්ත ලිපියක් අදාළ හමුදාවේ සුබසාධ අංශය විසින් නිර්දේශ කර ආවරණ ලිපියක් මගින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

III. 1 ශ්‍රේණියට ඇතුළත් කිරීම පිලිබඳ ඉල්ලීම් ආරක්ෂක අමාත්‍යාංශයේ සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය වෙත පමණක්ම යොමු කළ යුතු වේ.

IV. 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල මත පමණක් සිදුවන බැවින් ඒ සඳහා සහන ලබා ගැනීමට ඉල්ලීම් නොකළ යුතුය.

6. රණවිරුවන්ගේ කලත්‍රයන් හට රාජ්‍ය සේවයේ ස්ථාන මාරු ලබා ගැනීමට සහන සැලසීම.

7. රණවිරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වෙනත් සුභසාධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම.

8. ජාතික ආරක්ෂක අරමුදලේ ප්‍රතිපාදන යටතේ රණවිරුවන් වෙනුවෙන් අර්ධ නිවාස 145 ක් සඳහා රු.750,000.00 ක මූල්‍යාධාර ලබාදීම

**<u>රණවිරුවන්ට නිවාස ඉදිකිරගැනීම සඳහා රජයේ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය</u>**

| | **දිස්ත්‍රික්කය** | **ඉඩම වෙන කර ඇති ප්‍රා.ලේ. කොට්ඨාශය** |
|---|---|---|
| **01** | ගාල්ල | අක්මීමන |
| **02** | අනුරාධපුර | මහවිලච්චිය |
| **03** | අනුරාධපුර | පදවිය |
| **04** | මාතලේ | දඹුල්ල |
| **05** | මාතලේ | ලග්ගල - පල්ලේගම |
| **06** | පොළොන්නරුව | ඇළහැර |
| **07** | කුරුණෑගල | ගල්ගමුව |
| **08** | මාතලේ | නිකවැරටිය |
| **09** | පුත්තලම | ආණමඩුව |
| **10** | පුත්තලම | වනාතවිල්ලුව |
| **11** | පුත්තලම | මුන්දලම |
| **12** | මොණරාගල | බඩල්කුඹුර |
| **13** | රත්නපුර | කොලොන්නාව |